සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



B

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නාට්‍ය හා රංගකලාව - I

13 ශ්‍රේණිය

කාලය පැය 01 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර දී ඇති වරණ තුළින් තෝරා වරහන් තුළ ලියා දක්වන්න.

---

(01) න තජ්ඥානං න තච්ඡිල්පං
න සා විද්‍යා නසා කලා
නාසෞ යොගො න තත් කර්ම
නාට්‍යෙ ස්මින් යන්න දෘශ්‍යා තේ මෙම පද්‍ය සඳහන් වන්නේ,

(1) කාව්‍ය ශාස්ත්‍රයේ (2) නාට්‍ය ශාස්ත්‍රයේ (3) දශරූපයේ
(4) අභිඥාන ශාකුන්තලයේ (5) අර්ථ ශාස්ත්‍රයේ (........)

(02) නෘත්‍ය යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ,

(1) විචිත්‍රවත් හා රිද්මයානුකූල නර්තන වින්‍යාසයකි.
(2) ආංගික හා සාත්වික අභිනය මාර්ගයෙන් කිසියම් භාවයක් ප්‍රකාශ කෙරෙන නර්තන රටාවකි.
(3) චතුර්විධ අභිනය භාවිතයෙන් කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ නිරූපණය කරන්නකි.
(4) ප්‍රේක්ෂකයන්ගේ රස ජනනය උදෙසා ක්‍රියාපද හා සංවාද ස්වරූපයෙන් ලෝක ස්වභාවය හුවා දක්වන්නකි.
(5) වාචික අභිනය ප්‍රමුඛ මාධ්‍යය කරගත් නර්තන නිර්මාණයකි. (........)

(03) 16 වන ශත වර්ෂයේ ඉතාලියේ හා ප්‍රංශයේ බිහිව 19 වන ශත වර්ෂය වන විට ලොව පුරා පැතිරුණු සම්භාව්‍ය නාට්‍ය විශේෂයක් වන්නේ,

(1) ඔපෙරා (2) බැලේ (3) රූකඩ
(4) වේදිකා නාට්‍යය (5) පීකිං ඔපෙරා (........)

04 ''නාට්‍යය ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත් වල කැඩපතකි.'' මෙය පැවසුවේ,

(1) ඇලඩයිස් නිකොල් (2) ඇරිස්ටෝටල් (3) භරතමුනි
(4) ධනංජය (5) අභිනව ගුප්ත (........)

05 වේදිකාව මත සිදුවන සියලු කටයුතු භාරව සිටින්නේ,

(1) නාට්‍ය අධ්‍යක්ෂවරයා (2) සහාය අධ්‍යක්ෂවරයාය (3) නාට්‍ය නිෂ්පාදකයා
(4) රංග භූමි පාලක (5) පසුතල නිර්මාණ ශිල්පියා (........)

06 ප්‍රේක්ෂාව යනුවෙන් හඳුනාගත හැක්කේ

(1) නාට්‍යයක් නරඹන විට ප්‍රේක්ෂකයා ඉදිරියේ රංග භූමිය මොහොතින් මොහොත මැවෙන දර්ශනයය.
(2) කිසියම් චමත්කාරයක් හෝ රසඥතාවයකින් යුතු රූපණයකි.
(3) රූපණ ශිල්පීන්ගේ කුසලතා පිරි රංගන කාර්යයකි.
(4) සිද්ධි හා අවස්ථාය.
(5) ප්‍රේක්ෂක ප්‍රතිචාරය. (........)

07 රූපණය වනාහි ,

(1) චරිතයකට ආවේශ වීමයි. (2) චරිතයක් අනුකරණයයි.
(3) නළුවාගේ සාමූහිකත්වය ඇඟයීමයි. (4) සජීවී චරිත ඉදිරිපත් කිරීමයි.
(5) කථාවකට අනුව රංගනයයි. (........)

.08 තලමල පිපිලා, අන්දෙරේලා , ගුරුතරුව වැනි නාට්‍ය නිර්මාණය කළේ,

(1) හෙන්රි ජයසේන (2) ධම්ම ජාගොඩ (3) ජැක්සන් ඇන්තනි
(4) ජයලත් මනෝරත්න (5) දයානන්ද ගුණවර්ධන (........)

09 සයිමන් නවගත්තේගමගේ සුබ සහ යස වේදිකා නාට්‍යය සඳහා නිර්මාණ ප්‍රපංචය තෝරාගෙන ඇත්තේ,

(1) නාට්‍ය ශාස්ත්‍රයෙනි (2) චූල වංශයෙනි (3) මහා වංශයෙනි
(4) දීප වංශයෙනි (5) සද්ධර්ම රත්නාවලියෙනි (........)

10 සිංහල නාට්‍ය මණ්ඩලයේ ප්‍රථම නාට්‍ය ලෙස සහ සරත්චන්ද්‍ර මහතාගේ පළමු ස්වතන්ත්‍ර නාට්‍ය ලෙසත් නිර්මාණය කළ නාට්‍ය වන්නේ,

(1) මඟුල් ප්‍රස්තාව (2) මුදලාලිගේ පෙරළිය (3) පබාවතී
(3) වෙද හටන (5) බහින කලාව (........)

11 ක්ෂණික නිරූපණය සම්බන්ධයෙන් පහත සඳහන් කොට ඇති වැකි අතරින් නොගැලපෙන වාක්‍ය කුමක්දැයි තෝරන්න.

(1) රංග භාණ්ඩ ආදිය ක්ෂණිකව නිර්මාණය කරගත යුතුයි.
(2) දීර්ඝ කාලයක් පුහුණුවීම් කළ යුතුය.
(3) කේවළ හා සමූහ ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය.
(4) ක්ෂණික නිරූපණයේදී නව ජීවන අත්දැකීම් නිර්මාණශීලිව යොදාගත යුතුයි.
(5) පරිකල්පන ශක්තියද ඒ සඳහා උපකාරී වේ. (........)

12 වේදිකාව මත එකවර කක්ෂණ කිහිපයක් නිරූපණය කිරීම.

(1) නාට්‍ය ධර්මී ලක්ෂණයකි. (2) ලෝක ධර්මී ලක්ෂණයකි
(3) ග්‍රීක නාට්‍ය ලක්ෂණයකි. (4) ද්‍රවිඩ නාට්‍ය ලක්ෂණයකි.
(5) අසම්මත රංග නීති ලක්ෂණයකි. (........)

13 'කැතාසීස්තරණය' මුල් වරට පැනනැගුනේ,

(1) සංස්කෘත නාට්‍යයේ ය. (2) ග්‍රීක නාට්‍යයේ ය.
(3) රෝම නාට්‍යයේ ය. (4) විකාරරූපි නාට්‍යයේ ය.
(5) මිස්ටරි නාට්‍යයේය. (........)

14 ෂේක්ෂ්පියර්ගේ සෑම නාට්‍යයක්ම,

(1) අංක 03 කින් යුක්තය. (2) අංක 04 කින් යුක්තය.
(3) අංක 05 කින් යුක්තය. (4) අංක 10 කින් යුක්තය.
(5) අංකයකින් යුක්තය. (........)

15 පුරාණ ග්‍රීක නාට්‍යයකට අත්‍යවශ්‍ය වූයේ,

(1) අංග රචනය (2) වේදිකා සැරසිලි
(3) රංගාලෝකය (4) වෙස් මුහුණු
(5) පෙළ මතක්කරන්නන් (........)

16 මිනර්වා නාට්‍යවලට අයත් නොවන වේදිකා නාට්‍යය,

(1) රොඩී කෙල්ල (2) වැරදුණු කුරුමානම
(3) පෙරලෙන ඉරණම (4) කඩවුණු පොරොන්දුව
(5) කපටි ආරක්ෂකයා (........)

17 නළුවාගේ සුරක්ෂිත භාවය පිළිබඳව රජය කැපවී සිටි බවට සාක්ෂි දරන්නේ,

(1) කෞටිල්‍යයගේ අර්ථ ශාස්ත්‍රය (2) ශ්‍රී හර්ෂදේව නාගනන්දය
(3) ශුද්‍රකගේ මෘච්ඡකටිකය (4) කාලිදාසගේ මේඝදූතය
(5) භාසගේ ඌරුභංගය (........)

18 19 සියවසේ යුරෝපයේ බිහි වූ නාට්‍යකරුවෙකි.

(1) එමිල්සෝලා (2) ඇන්ටන් චෙකොෆ්
(3) බර්නාඩ් ෂෝ (4) විලියම් ශේක්ෂ්පියර්
(5) ගාර්ෂියා ලෝර්කා (........)

19 පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ දමිල නාට්‍ය කලාවේ පුරෝගාමියෙකි,

(1) මහාචාර්ය විද්‍යානන්දන් (2) මහාචාර්ය කේ. සිවතම්බි
(3) මහාචාර්ය කේ. කනපතිපිල්ලේ (4) එස්. ශන්මුගලිංගම්
(5) එස්. මෞනගුරු (........)

20 දමිල නාට්‍ය කලාවේ එන පොතේගුරු හැඳින්වෙන්නේ,

(1) පච්චමීරා ලෙස ය. (2) කෝනංගි ලෙසිනි.
(3) කට්ටියක්නින් ලෙසිනි. (4) අන්නවියාර් ලෙසිනි.
(5) පුලසන් දොර් ලෙසිනි. (........)

21 රුසියානු ජාතික ගොගොල්ගේ නාට්‍යයක් ඇසුරෙන් මෙරට නිෂ්පාදනය වූ නාට්‍යයකි.

(1) මුහුදු පුත්තු (2) කපුවා කපෝති
(3) හුණුවටය (4) ජනේලය (........)
(5) දේවතා එළිය

22 සයිමන් නවගත්තේගම නාට්‍ය නිර්මාණයකි.

(1) පුස්ලෝඩං (2) ලියතඹරා
(3) අහසින් වැටුණු මිනිස්සු (4) සිරිබෝ තට්ටුව
(5) මකරා (........)

23 දෙයක් වේ නම් යම් සුදුස්සාටම අයිති විය යුතුය..... යන ප්‍රකාශනය අඩංගු නාට්‍ය නිර්මාණයකි.

(1) රූකඩ ගෙදර (2) සුභ සහ යස
(3) හුණුවටය (4) ඇන්ටිගනි
(5) ඔතෙලෝ (........)

24 සංධිම යනු,

(1) ලණු මගින් ක්‍රියාකළ හැකි උපකරණ
(2) මී ඉටි මගින් සකසනු ලද උපකරණ
(3) බටපතුරු සහ සැහැල්ලු ද්‍රව්‍යයෙන් තැනූ උපකරණයයි.
(4) ඇඳුම් පැළඳුම් ය. (........)
(5) අඩම ගනයේ පාත්‍රයින් භාවිතා කළ නාමයයි.

25 බටහිර නාට්‍ය කලාව හා සම්බන්ධය

(1) ත්‍රිවිධ ඒකීයත්වය (2) සතර අභිනය (3) තාත්වික වාදය
(4) දුරස්ථිකරණ රංග රීතිය (5) රුධිරු රංගය (........)

26 ග්‍රීක කොමඩියක ප්‍රධාන ලක්ෂණය වනුයේ,

(1) ගාන වෘන්ද සංඛ්‍යාව 24 කි.
(2) නළුවන් සඳහා වෙස්මුහුණු භාවිතා කරයි.
(3) ප්‍රීතිමත් අවසානයකි.
(4) ගාන වෘන්දයේ සමුරයන්ගෙන් යුක්තයි.
(5) ප්‍රේක්ෂකයින් නළුවන් ලෙසටද පෙනී සිටියි. (........)

27 ස්ත්‍රී භූමිකා සඳහා පිරිමින් යොදා ගත් පැරණි නාට්‍ය සම්ප්‍රදාය,

(1) එලිසබෙත් (2) කබුකි (3) නෝ
(4) සංස්කෘත (5) නාඩගම් (........)

28 ''සටුර ''නාට්‍යයක් ,

(1) ට්‍රැජඩි තුනක් අවසානයේ රඟ දක්වයි.
(2) සමුරයන්ගෙන් යුක්තයි
(3) කොමඩි නාට්‍ය රචකයාගේම රචනයකි.
(4) ප්‍රේක්ෂකයාට හාස්‍ය ලබා දුනි.
(5) දිවා කාලයේ රඟ දැක්වීය. (........)

29 මධ්‍යකාලීන යුරෝපයේ බිහි වූ නාට්‍ය ප්‍රභේදයකි.

(1) සදාචාර (2) ප්‍රාතිහාර්ය (3) අභූතරූපි
(4) අද්භූත (5) ග්‍රීක නාට්‍ය (........)

30 නාඩගම් සංගීතය සඳහා යොදා ගනු ලබන තාල වාද්‍ය භාණ්ඩය

(1) පක්වාජය යි. (2) මද්දලය යි. (3) මෘදංගය යි.
(4) ඩොල්කිය යි. (5) සර්පිනාව යි. (........)

31 ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය ඉංග්‍රීසි නාට්‍ය කලාවක් බිහි කිරීමෙහිලා පුරෝගාමී වූ නාට්‍යකරු වන්නේ,

(1) නියුමන් ජුබාල් (2) රංජනි ඔබේසේකර (3) ඊ. එෆ්. සී. ලුඩෝවයික්
(4) මානෙල් ජයසේන (5) සී. ඩබ්. අමරසිංහ (........)

32 මිනර්වා නාට්‍ය ව්‍යාපාරයේ පුරෝගාමියා ,

(1) සිරිසේන විමලවීර (2) චාල්ස් ඩයස් (3) සී. දොන් බස්තියන්
(4) බී. ඒ. ඩබ්. ජයමාන්න (5) පිලිප්පු සිංඤෝ (........)

- පහත නාට්‍ය සම්ප්‍රදායන් ඇසුරෙන් 33 සිට 35 දක්වා පිළිතුරු සපයන්න.

A ග්‍රීක නාට්‍යය B සංස්කෘත නාට්‍යය
C මධ්‍යකාලීන යුරෝපීය නාට්‍යය D නෝ නාට්‍යය
E එලිසබෙතීන නාට්‍යය

33 වෙස් මුහුණු භාවිතා කළ නාට්‍ය සම්ප්‍රදාය

(1) A හා E ය. (2) A හා D ය. (3) C හා D ය.
(4) B හා A ය. (5) D හා E ය. (........)

34 නළුවන් අවම ගණනක් යොදාගත් නාට්‍ය සම්ප්‍රදාය

(1) D හා C ය. (2) B හා E ය. (3) A හා C ය.
(4) A හා D ය. (5) D හා E ය. (........)

35 ආගමික මුහුණුවරක් ගත් නාට්‍ය සම්ප්‍රදාය

(1) B හා E ය (2) A හා D ය. (3) B හා C ය.
(4) E හා D ය . (5) A හා B ය. (........)

36 පශ්චාත් දෘෂ්ටිකථන ක්‍රමය අනුගමනය කළ නාට්‍ය විශේෂය

(1) A (2) B (3) C ය.
(2) E (3) D (........)

37 නාට්‍ය හා රචනය හා අධ්‍යක්ෂණය සඳහා වෙනමම පුද්ගලයන් සිටි නාට්‍ය සම්ප්‍රදාය

(1) A (2) B (3) C ය.
(2) E (3) D (........)

38 සංස්කෘත නාට්‍යයේ ප්‍රකාශිත භාෂණ විධි ගණන

(1) 5යි. (2) 6 යි (3) 7යි.
(2) 9 යි. (3) 8 යි. (........)

39 බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ස්වකීය රංගකාර්යයේදී යොදා ගත් රංග රීතිය වන්නේ,

(1) තදාත්ම්‍ය රංගනය. (2) යථාර්ථවාදී රංගනය (3) අනුරූපණ රංගනය
(4) දුරස්ථීකරණ රංගනය (5) ආත්මීකරණ රංගනය (........)

40 නළුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් එකම හඬින් එක විටම වදන් පැවසීම.

(1) සාමූහික භාෂණ (2) ඒකල භාෂණ (3) ආකාශ භාෂිත
(4) ප්‍රකාශ භාෂණ (5) ජනාන්තික භාෂණ (........)

(ල. 01 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



**B**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

**13 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- **A හා B කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

## A කොටස

01 (01) ප්‍රාසාංගික කලාවේ විශේෂණ පැහැදිලි කරන්න.

(02) ප්‍රාසාංගික කලා නම් කොට එයින් 02 ක් පිළිබඳ විමර්ශනය කරන්න.

(03) ප්‍රාසාංගික කලා අතර නාට්‍ය දරණ සුවිශේෂීත්වය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 15)

02 (01) සොකරි නාට්‍යයේ පුරාවෘත්තය කෙටියෙන් පහදන්න.

(02) සොකරි නාට්‍යයේ පූජාර්ථ අරමුණු පැහැදිලි කරන්න.

(03) කෝලම් නාට්‍යයේ විශේෂතා පහදන්න (ලකුණු 15)

03 (01) ඇන්ටිගනී නාට්‍යයේ ගැටුම් අවස්ථා කෙටියෙන් පහදන්න.

(02) එම ගැටුම් අවස්ථා නාට්‍යය වේදජනකයක් කරා ගෙන යන අයුරු පහදන්න.

(03) සොෆෝක්ලීස් එම නාට්‍ය මගින් දීමට අපේක්ෂා කළ අරමුණු සඵල වීද? ඔබේ අදහස් දක්වන්න (ලකුණු 15)

## B කොටස

04 (01) 'සුභ සහ යස ' නාට්‍යය කැපීපෙනෙන්නේ කවර හේතූන් නිසාදැයි පහදන්න.

(02) එම නාට්‍යය මගින් ඉදිරිපත් කෙරෙන විවරණය සැකෙවින් දක්වන්න

(03) සුභ සහ යස නාට්‍යයට ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබී ඇති අයුරු පහදන්න. (ලකුණු 15)

05 (01) ''අභිඥාන ශාකුංතලයට'' අදාළ මූලාශ්‍රය ලියන්න.

(02) එයට කාලිදාස සිදුකර ඇති වෙනස්කම් මොනවාද?

(03) සංස්කෘත නාට්‍යයේ කතා විකාශනය හා බැඳුණු ප්‍රධාන අවස්ථා නිදසුන් මගින් පහදන්න. (ලකුණු 15)

06 (01) ''කැතාසිස්කරණය'' සංකල්පය පහදන්න.

(02) ග්‍රීක ට්‍රැජඩියක මූලිකාංග හඳුන්වන්න.

(03) ග්‍රීක ටැජඩියක කතා නායකයා මුහුණ දෙන විවිධ ඛේදනීය තත්වයන් පිළිබඳ ඔබ උගත් නාට්‍යයක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

( මුළු ලකුණු 4x 15 = 60 )